## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2017

-----------------------------------------------------------

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 25 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

ප්‍රමිතයේ 41 හා 42 ඡේද අනුව පූර්ව වර්ෂවල සිදු වූ වැරදි මත සිදු කරන ගැලපුම්වල ප්‍රමාණාත්මකභාවය අනුව අතීතානුයෝගීව ගිණුම්වල ගැලපීම් කළ යුතු වුවද ඊට පටහැනි ලෙස අධිකාරිය විසින් 2006-2015 කාලපරිච්ඡේදයට අදාලව ගෙවන ලද රු.67,746,000 ක් වූ සේවක අර්ථසාධක අරමුදලේ දායක ගෙවීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව වත්කමක් පාවිච්චිය සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද ඊට පටහැනි ලෙස මිලදී ගත් සම්පූර්ණ වර්ෂය සඳහාම ක්‍ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර වෙනසක් වේ නම් එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස ගිණුම්වල හෙළිදරව් කළ යුතු විය. එහෙත් අධිකාරිය විසින් එපරිදි අවශ්‍ය ගැලපුම් සිදුකර නොතිබූ අතරම ප්‍රමිතයට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් මගින් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 29 වන ඡේදය අනුව අධිකාරිය විසින් සියළු දේපළ පිරියත හා උපකරණ ගිණුම් තැබීම සඳහා පිරිවැය ක්‍රමය හෝ ප්‍රත්‍යාගණන ක්‍රමය යන ක්‍රම දෙකෙන් එකක් තෝරා ගත යුතු වුවද අධිකාරිය විසින් එම ක්‍රම දෙකම ගිණුම් තැබීමේදී ප්‍රතිපත්ති ලෙස හඳුනාගෙන තිබුණි.

(iv) ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයේ ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ප්‍රත්‍යාගණනය කිරීමක් අවශ්‍ය වුවද 2008 වර්ෂයෙන් පසුව කිසිදු වත්කමක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18

-------------------------------------

ප්‍රමිතයේ 20 ඡේදය අනුව සේවා සපයන ආයතනයක් විසින් සිය මෙහෙයුම් ආදායම් හඳුනා ගැනීමේදී අනුගමනය කරන ගිණුම් ප්‍රතිපත්ති, ප්‍රමිතයේ සඳහන් ආකාරයට විස්තරාත්මකව හෙළිදරව් කළ යුතු වුවද අධිකාරිය විසින් අර්ධ කාලීන පුහුණු පාඨමාලා ආදායම් හඳුනා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රමිතයේ සඳහන් අවශ්‍යතා පරිදි හඳුනාගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

----------------------------------

ප්‍රමිතයේ 57 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සේවක පාරිතෝෂික වගකීම පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන ගණනය කර ගිණුම්ගත කළ යුතු වුවත් අධිකාරිය විසින් පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීම සඳහා සේවකයා අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන ගණනය කිරීම් සිදුකර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි සිට 2015 මැයි මාසය දක්වා ජීවන වියදම් දීමනාවට අදාළව සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.27,021,229 ක් හා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.6,755,307 ක් වූ සේවායාගේ දායක මුදල් හා එයට අදාලව ගෙවිය යුතු රු.13,539,553 ක් වූ අධිභාර මුදල්ද, සේවක අර්ථසාධක අරමුදලේ සේවක දායකත්වය වූ රු.72,261,572 ක් ඇතුළුව එකතුව රු.119,577,661 ක වියදම් ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සේවා ගිවිසුම් 07 කට අදාලව 2018 වර්ෂය වෙනුවෙන් දරන ලද රු.254,364 ක වියදම් හා 2016 වර්ෂයේ උපචිත වියදම ලෙස හඳුනා ගෙන නොතිබූ එහෙත් 2017 වර්ෂයේදී වැය කරන ලද රු.423,750 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) පොතුවිල් සහ රොක්හිල් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල නවීකරණ කටයුතු අවසන් කර එම වියදම් ප්‍රාග්ධනිත කර තිබූ නමුත් එම නවීකරණයට අදාලව තෙකලා විදුලි මනු වෙනත් ස්ථානවලට මාරු කිරීම සඳහා දරන ලද රු.240,470 ක වියදම තවදුරටත් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී වැඩ අවසන් කර තිබූ, ගොඩකවෙල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් කාර්මික වැඩහල් ගොඩනැගිල්ලේ වහලය හා කාප්පය (Truss) පිළිසකර කිරීමේ කටයුතු 2016 වර්ෂයේදී අවසන් කර තිබූ නමුත් ඒ වෙනුවෙන් වැයකරන ලද රු.278,887 ක් අදාල වත්කම් ගිණුමට ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඉ) පනාපිටිය පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා සමරු ඵලකයක් සකස් කිරීම වෙනුවෙන් දරන ලද රු.93,500 ක් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි.

### 2.2.3 අසම්භාව්‍ය බැරකම්

----------------------

ආයතනයේ සේවකයෙකු විසින් ආයතනයට විරුද්ධව පවරා තිබූ නඩුවකට අදාලව කම්කරු විනිශ්චය සභාවක් විසින් 2018 අගෝස්තු 23 දින ලබා දී තිබූ තීන්දුවක් මත අදාල නිලධාරියාට රු.3,227,737 ක වන්දියක් ගෙවීමට නියෝග කර තිබුණද ඒ සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

තවද සේවකයන් විසින් ආයතනයට එරෙහිව පවරා තිබුණු නඩු 07 ක් හා ආයතනය විසින් සේවකයෙකුට එරෙහිව පවරා තිබුණු එක් නඩුවක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෘත්තීය පුහුණු හා ග්‍රාමීය අමාත්‍යාංශයෙන් වර්ෂ 17 ක සිට සහ ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු අධිකාරියෙන් වර්ෂ 14 ක සිට අයකර ගත යුතු පිළිවෙලින් රු. 3,548,335 ක් හා රු.527,436 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) දැනට වසා දමා ඇති ලක්සල ආයතනයෙන් වර්ෂ 12 කට වඩා වැඩිකාලයක සිට රු.1,437,200 ක ශේෂයක් අයකරගත යුතුව තිබුණි.
(අ) හා (ආ) ඡේදවල සඳහන් ලැබිය යුතු ශේෂ අයකරගත නොහැකි නිසා එම ශේෂ කපාහැරීම සඳහා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇති බව අධිකාරියේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ 2011 වර්ෂයේ සිට පැවත එන රු. 11,732 ක් වූ ආදායම් හිඟය සමාලෝචිත වර්ෂ අවසානය දක්වා නිරවුල් කරගෙන නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේදී මිලදීගත් ස්ථාවර වත්කම් වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.1,875,747 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයේ පැවති අඩුපාඩුකම් නිසා වර්ෂය තුලදීද නිරවුල් කර නොතිබුණි.

(ඉ) 2004 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිලධාරින් 10 දෙනෙකුට ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු අරමුදල් දායක මුදල් රු. 111,871 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිරවුල්කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | මුදල් රෙගුලාසිය ප්‍රකාරව අලාභ හානි ලේඛනයක් පවත්වාගෙන යායුතු වුවද ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල එබඳු ලේඛන පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 188 (2) | 2009 වර්ෂයේ බැංකුවේ තැන්පත් කළ රු.49,644 ක් වූ චෙක්පත් 2 ක් 2017 දෙසැම්බර් 31 වනවිටත් උපලබ්ධි වී නොතිබිය දී ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 272 (3) | එකතුව රු. 4,651,292 ක් වූ ගෙවීම් වවුචර් 13 කට අදාලව මුල් පිටපත් හා අදාල බිල්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 502 (2) | මුදල් රෙගුලාසි ප්‍රකාරව යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. කෙසේ වුවද පරිගණකගත නව ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමේ කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර එහි කටයුතු සියයට 90 ක් 2018 සැප්තැම්බර් 18 දින වන විට අවසන්කර ඇති බව අධිකාරියේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් 18 දෙනෙකුට වර්ෂ 2 කට වැඩි කාලයක සිට ගෙවිය යුතුව ඇති රු.8,817,754 ක රඳවා ගැනීම් මුදල් හා රු.584,996 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය පරිදි අරමුදලක් පිහිටුවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවද මහා භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව රක්‍ෂණ අරමුදලක් පිහිටුවා තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ආධුනිකයන්ගෙන් රු. 500 බැගින් එකතු කරන ලද මුදලින් එකතුව රු.37,883,500 ක් අධිකාරියේ බැංකු ගිණුමක තැන්පත්කර වර්ෂය තුළදී රු.507,000 ක රක්ෂණ වන්දි මුදලක් ගෙවා තිබුණි.

(ආ) (i) ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2015 සැප්තැම්බර් 04 වන දින මඩකලපුව, වව්නියාව, මන්නාරම, අම්පාර යන දිස්ත්‍රික්කවල පාඨමාලා 12 ක් සංවර්ධනය කිරීම සඳහා ආධාර වශයෙන් රු.32,229,600 ක් ලබාදීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. නමුත් විදේශාධාර ලබාදීම සම්බන්ධයෙන් 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 2 ඡේදය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

(ii) තවද එම චක්‍රලේඛයේ 4:4:1 ඡේදය ප්‍රකාරව ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ලබා දී තිබූ විදේශාධාර රේඛීය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය මගින් ලබා දී නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4.5 ඡේදයට පටහැනිව සහ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධිකාරියේ ක්ෂේත්‍ර රාජකාරීවල යෙදෙන නිලධාරීන්ට පාලක මණ්ඩල අනුමැතිය මත රාත්‍රී නවාතැන් පහසුකම් සඳහා දිනකට මාණ්ඩලික නිලධාරීන්ට රු.2,500 ක් හා අනෙකුත් නිලධාරීන්ට රු.2,000 ක්ද වශයෙන් සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 132,115,206 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.33,280,068 ක් වුයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.165,395,274 ක පිරිහීමක් සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ පුනරාවර්තන ප්‍රදාන පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.24,900,000 ක් වැඩියෙන් හා පුනරාවර්තන ප්‍රදාන සඳහා අමාත්‍යාංශයෙන් රු.124,146,500 ක් ලැබී තිබුණද අනෙකුත් ආදායම් රු. 146,925,569 කින් අඩුවීම හා කාර්යමණ්ඩල වියදම රු.149,189,026 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරේ ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2016 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක්ද ඉතිරි වර්ෂවල ඌනතාවයන්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2013 වර්ෂයේ ආයතනයේ දායකත්වය රු. 1,023,595,450 ක් වූ අතර 2017 වර්ෂයේදී රු.1,438,489,867 ක් වී තිබුණි. ආයතනයේ දායකත්වය 2016 වර්ෂය දක්වා වැඩිවීමක් පෙන්නුම් කර තිබූ අතර 2017 වර්ෂයේ දී රු.31,818,127 කින් පහත වැටී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

(අ) 2014 – 2018 වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) අධිකාරියට නිපුණතා පාදක උසස් කිරීම්, කාර්ය මණ්ඩල දීමනා ආදිය ඇතුළත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණක් වී තිබුණි. එහෙත් එබඳු සැලැස්මක් 2017 වර්ෂය අවසානය තෙක් සකස් කර නොතිබුණු අතර උපදේශකවරුන්ගේ සුදුසුකම් මට්ටම් පිළිබඳ දත්ත පද්ධතියක් හෝ පවත්වා නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් වර්ෂ කිහිපයක සිට ශ්‍රම වෙළඳපල ඉල්ලුම හා සැපයුම පිළිබඳ විධිමත් පර්යේෂණ පවත්වා නොතිබුණු අතර ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම සඳහා ද අවධානය යොමුකර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය තුළ ක්ෂේත්‍ර 19 කට අදාලව පාඨමාලා 1,544 කට අයත් පූර්ණ කාලීන හා අර්ධ කාලීන පුහුණු වැඩසටහන් 2,663 ක් සඳහා ආධුනිකයින් 37,239 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබූ අතර ක්ෂේත්‍ර 19 හි වැඩසටහන් 2,094 ක් පවත්වා තිබූ අතර ඒ සඳහා ආධුනිකයින් 36,695 ක් බඳවා ගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ.

| ක්ෂේත්‍රය | 2016 ඉලක්ක ගත ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව | 2016 සත්‍ය ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව | 2017 ඉලක්ක ගත ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව | 2017 සත්‍ය ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ▪ තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය | 7,890 | 7,439 | 8,440 | 9,360 |
| ▪ පුද්ගල හා සමාජ | 3,930 | 4,453 | 4,875 | 5,436 |
| ▪ රෙදිපිළි හා ඇඟළුම් | 4,840 | 3,842 | 4,630 | 4,276 |
| ▪ විදුලි විද්‍යුත් හා විදුලි සංදේශ | 3,850 | 3,316 | 3,790 | 3,695 |
| ▪ ගොඩනැගිලි හා ඉදිකිරීම් | 3,630 | 3,091 | 3,655 | 3,692 |
| ▪ ඉතිරි ක්ෂේත්‍ර 14 | 11,320 | 9,396 | 11,849 | 10,236 |
| | 35,460 | 31,537 | 37,239 | 36,695 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) 2017 වර්ෂයේදී 2016 වර්ෂයට සාපේක්ෂව ඉලක්කගත බඳවාගැනීම 1,779 කින් වැඩිකර තිබූ අතර එයින් 1,495 ක්ම වැඩි කර තිබුණේ තොරතුරු තාක්‍ෂණ (IT) හා පුද්ගල සංවර්ධන (රූපලාවන්‍ය හා කොණ්ඩ මෝස්තර) ක්ෂේත්‍රවල බවත් අනෙකුත් ප්‍රධාන වෘත්තීමය ක්ෂේත්‍රවල නොවන බවත් නිරීක්‍ෂණය විය. ඒ අනුව අධිකාරිය විසින් ශ්‍රම වෙළඳ පොළ අවශ්‍යතා අනුව පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සිදු නොකරන බව නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව ආධුනික බඳවා ගැනීම් සියයට 16 කින් හෙවත් 5,158 කින් වර්ධනය වී තිබූ අතර පාඨමාලා හැරයාම් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 04 කින් වර්ධනය වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ තොරතුරු තාක්‍ෂණ හා පුද්ගල සංවර්ධන පාඨමාලා සඳහා ඉලක්කගත ප්‍රමාණයටත් වඩා ආධුනිකයින් 920 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර සියලු පාඨමාලා, ගාස්තුවලින් නිදහස් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ගාස්තු නිදහස් කිරීම මේ සඳහා හේතු වී තිබූ බව තවදුරටත් නිරීක්‍ෂණය විය.

(iii) සැලසුම් කර තිබූ පූර්ණ කාලීන පාඨමාලාවලට අයත් වැඩසටහන් 354 ක් හා අර්ධ කාලීන පාඨමාලාවලට අයත් වැඩසටහන් 215 ක් උපදේශක හිඟය ඇතුළු හේතූන් මත ක්‍රියාත්මක කර නොතිබුණි. එයින් පිළිවෙලින් වැඩසටහන් 56 ක් හා 52 ක් මෝටර්රථ අළුත්වැඩියා නඩත්තු සහ ගොඩනැගිලි ඉදිකිරීම් යන වෙළඳපොළ වැඩි ඉල්ලුමක් සහිත ක්ෂේත්‍රයන්හි විය.

(iv) ප්‍රවර්තන වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම්කර තිබූ හෝටල් හා සංචාරක, ලෝහ හා ලුහු ඉංජිනේරු සහ ධීවර හා මත්ස්‍ය වගාව යන අර්ධ කාලීන පාඨමාලා උපදේශකවරුන් ඉදිරිපත් නොවීම, ගෙවීම් ප්‍රමාණවත් නොවීම වැනි ගැටළු නිසා පවත්වා නොතිබුණි.

(v) දැව ආශ්‍රිත නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, මුද්‍රණ හා ඇසුරුම්, ලෝහ හා ලුහු ඉංජිනේරු, සම් ආශ්‍රිත නිෂ්පාදන වැනි වෘත්තීය පුහුණු අංශ සඳහා බඳවා ගැනීම් වැඩි කිරීමට හා සමාජ අවශ්‍යතා පරිදි නව ක්ෂේත්‍ර හඳුන්වාදීම කෙරෙහි අධිකාරියේ අවධානය යොමු වී නොතිබුණි.

(vi) මන්නාරම, මුලතිව් දිස්ත්‍රික් මධ්‍යස්ථාන හා මඩකලපුව, බද්දේගම, මීරිජ්ජවිල ජාතික මධ්‍යස්ථානයන්හි පාඨමාලා සංඛ්‍යාව හා බඳවාගැනීම් සංඛ්‍යාව එම මධ්‍යස්ථානවල ධාරිතාවයට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය වූ අතර එම දිස්ත්‍රික් හා ජාතික මධ්‍යස්ථානවල පාඨමාලා බඳවා ගැනීම් වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(vii) දිස්ත්‍රික් අනුව වැඩිම පාඨමාලා හැරයාම් ප්‍රමාණය වූ 289 අම්පාර දිස්ත්‍රික්කයෙන් නිරීක්ෂණය වූ අතර එය බඳවා ගැනීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් වී තිබුණි.

**(ඇ) රැකියාගත කිරීම් පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) 2017 වර්ෂයේ රැකියාගත කිරීම් අංශයේ (Job Placement) ඉලක්කගත රැකියාගත කිරීම් ප්‍රමාණය 8,300 ක් වූ අතර සත්‍ය රැකියාගත කිරීම් ප්‍රමාණය 6,661 ක් වී තිබුණි.

(ii) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ විදේශීය රැකියාගත කිරීම් ප්‍රමාණය සියයට 28 කින් අඩු වී තිබුණි. විදේශීය රැකියාගත කිරීම් වැඩි කිරීම සඳහා විදේශ රැකියා වෙළඳපල පදනම් කරගත් විධිමත් වැඩපිළිවලක් අධිකාරිය සතුව නොපවතින අතර සමස්ත රැකියාගත කිරීම් වලින් විදේශීය රැකියාගත කිරීම් සියයට 02 ක් වැනි ඉතා අවම මට්ටමක පැවතුණි.

(iii) පෙර වර්ෂයට සාපේක්ෂව දේශීය රැකියාගත කිරීම් සියයට 06 කින් වර්ධනය වී තිබුණද ඉලක්කගත සංඛ්‍යාව හා සැසඳීමේදී සියයට 23 කින් අඩු වී තිබුණි.

(iv) ක්ෂේත්‍ර අනුව රැකියාගත කිරීම් ප්‍රමුඛතා අනුපිළිවෙලෙහි ඉහළම ස්ථානය විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රයට හිමි වී තිබූ අතර එම ප්‍රමාණය 971 ක් වී තිබුණි. තවද සමස්ත රැකියාගත කිරීම්වල ප්‍රතිශතයක් ලෙස එය සියයට 15 ක ප්‍රමාණයකි. නමුත් මැණික් හා ස්වර්ණාභරණ, මුද්‍රණ හා ඇසුරුම්, ධීවර හා මත්ස්‍ය වගාව, සම් ආශ්‍රිත නිෂ්පාදන වැනි ක්ෂේත්‍රයන්හි රැකියාගත කිරීම් සමස්ත රැකියාගත කිරීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට එකකටත් වඩා අඩු මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. එම ක්ෂේත්‍රවලට අදාල පාඨමාලා කාලීන අවශ්‍යතා අනුව සකස්කර ඉදිරිපත්කර නොතිබුණි.

(v) අධිකාරියෙන් පුහුණුව ලබා ඉවත්වන පුහුණුලාභීන් රැකියාගත කිරීම සම්බන්ධව පසුවිපරම් කර නොතිබූ අතර ඒ පිළිබඳ දත්ත පද්ධතියක් අධිකාරිය සතුව නොමැති වීමෙන් රැකියාගත කිරීම් පිළිබඳ සංඛ්‍යාවල නිවැරදිතාවය විගණනයේදී තහවුරුකරගත නොහැකි විය.

**(ඇ) පර්යේෂණ හා සංවර්ධන අංශයේ කටයුතු පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් පර්යේෂණ හා අධ්‍යයනයන් 04 ක් සම්පූර්ණ කිරීම සඳහා රු. මිලියන 1.5 ක් වර්ෂය සඳහා වෙන් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ එක් අධ්‍යයනයක් පමණක් අවසන් කර තිබුණි.

(ii) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වූ “වෘත්තීය පුහුණුව ලැබූවන් පිළිබඳ ඡායා අධ්‍යයනය - කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක 2014/2015” යන පර්යේෂණය 2017 වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

(iii) අධිකාරියේ උපදේශකවරුන් සේවය හැරයාමට හේතු වන කරුණු සොයා බැලීමේ අධ්‍යයනය හා අධිකාරියේ පුහුණුව අවසන් කරන පුහුණුලාභීන් අවසාන ඇගයීම් සඳහා සහභාගීත්වය අඩුවීමට හේතු හඳුනා ගැනීම සහ සහතික පත්‍ර ලබා ගැනීමේ ප්‍රවණතාවය අවමවීමට හේතු හඳුනා ගැනීම සඳහා වූ පර්යේෂණ අධ්‍යයන 2017 වර්ෂය තුල අවසන් කිරීමට නියමිත වුවද එම කටයුතු මූලික අධියරයෙහි පැවතුණි.

(iv) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ශක්‍යතා අධ්‍යයන 05 ක් සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනා ගනිමින් ඊට අදාලව පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීම පර්යේෂණ අංශයේ ප්‍රධාන අරමුණ වුවද ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(ඉ) අනෙකුත් දිස්ත්‍රික්කවල ඉඩම් පුනරුත්ථාපනය සඳහා රු.මිලියන එකක් වෙන්කර තිබූ අතර එයින් හිඟුරක්ගොඩ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, නාරාහේන්පිට ජාතික මධ්‍යස්ථානය හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ ඉඩම් පුනරුත්ථාපනය සිදුකර තිබූ අතර ඒ සඳහා රු. 2,098,601 ක් වැය කර තිබූ අතර වෙන්කර තිබූ මුදල් ප්‍රමාණය ඉක්මවා රු.1,098,601 ක් වැයකර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුල ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මධ්‍යස්ථානයේ ආරක්ෂක සේවා සිදු කිරීමට යොදවා තිබූ ආරක්ෂක නිලධාරීන් අඛණ්ඩව දින 5 සිට 28 ක පරාසයක සේවයේ යෙදී තිබූ බව නිරීක්ෂණය වූ අතර එලෙස සේවයේ යෙදී සිටීමෙන් ආරක්ෂක සේවය අපේක්ෂිත පරිදි එම නිලධාරියාගෙන් ඉටු නොවන බව සහ දින දෙකකට වඩා එක දිගට සේවය ලබාගැනීම කම්කරු ආඥා පනතේ නීතිරීතිවලට පටහැනි බව නිරීක්ෂණය විය.

(ආ) 2017 පෙබරවාරි 20 දින මෝටර් රථ අනතුරකින් තුන්වන පාර්ශවයන්ට සිදුව තිබූ අලාභ වෙනුවෙන් රු.322,232 ක් අධිකාරියේ අරමුදලින් ගෙවා තිබූ අතර ඊට අදාල රක්ෂණ ආයතනෙයෙන් මුදල් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට 2015 මැයි දක්වා කාලසීමාවට අදාලව ජීවන වියදම මත සේවක භාරකාර අරමුදලට අධිකාරියේ සේවයේ නියුතු සේවකයන් වෙනුවෙන් සියයට 03 ක් වූ රු.27,098,089 ක දායක මුදල් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය විසින් 2017 ජූලි 07 දින රු.13,549,044 ක අධිභාරයක් පනවා තිබුණු අතර 2016 වර්ෂයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතු බව දන්වා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් අධිභාර මුදල අයකර ගැනීමට කටයුතු කරන ආකාරය පිළිබඳව දන්වන ලෙස නියෝග කර තිබුණි. නමුත් අධිකාරිය විසින් අදාල නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහි විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතුකර නොතිබූ අතර අධිභාර මුදල් ගෙවීමට අවශ්‍ය අයවැය ප්‍රතිපාදන අධිකාරියට නොතිබියදී මුදල් අංශය විසින් ඉදිරිපත්කර තිබූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 02 මගින් මෙම මුදල වාරික 12 කින් ගෙවා නිම කිරීමට 2018 ජූලි 24 දින පාලක සභා අනුමැතියට ඉදිරිපත්කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ උපසභාපතිවරයා සඳහා පෞද්ගලික ආයතනයකින් කුලී පදනම මත 2017 ඔක්තෝබර් 27 දින සිට 2017 නොවැම්බර් 27 දින දක්වා ලබාගෙන තිබූ මෝටර්රථයක් සඳහා ධාවන සටහන් පත්‍රයේ සඳහන් ධාවන දුර ප්‍රමාණය ඉක්මවා කිලෝමීටර් 601 ක් සඳහා ගෙවීම් සිදුකිරීමෙන් රු.21,035 ක් වැඩියෙන් ගෙවා තිබුණු අතර මෙම මෝටර් රථය 2017 නොවැම්බර් මාසයේදී ධාවන සටහන් පත්‍ර අනුව ධාවනය කර නොතිබියදී ඉන්ධන ලීටර් 780 ක් සඳහා රු.74,500 ක් ගෙවා තිබුණි.

(ආ) අධිකාරියේ සභාපතිවරයා වෙත මෝටර් රථයක් වෙන්කර තිබියදී මාසිකව රු. 90,000 ක කුලී ගාස්තුවක් ගෙවීමේ පදනම මත මෝටර් රථයක් ලබාගෙන තිබුණි. අධිකාරිය මගින් සභාපති වෙත වෙන් කරන ලද වාහනය සඳහා අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ඉන්ධන සැපයීම වෙනුවෙන් රු.54,267 ක් වැය කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයෙන් පසු ඉවත් කරන ලද වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ගලපා නොතිබූ අතර ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලැයිස්තුව අනුව 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 8,576 ක් වූ වර්ග 09 කට අයත් ස්ථාවර වත්කම් අයිතම ඒකක 185,948 ක් අධිකාරිය සතුව පැවැති නමුත් එකිනෙක වත්කම් භෞතිකව හඳුනා ගැනීම සඳහා අංකන ක්‍රමයක් (Code System) භාවිතාකර නොතිබුණි. මේ නිසා ලේඛනයේ පවත්නා වත්කම්වල භෞතික පැවැත්ම නිශ්චය කර ගැනීමට නොහැකි විය.

(ඈ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදුන් රු. 10,427,342 ක් එම අරමුණු සඳහා යොදා නොගෙන මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි.

## 4.4 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු. 1,500,000 ක් වූ සහ 2017 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.112,627 ක් වූ ලංකා අශෝක් ලේලන්ඩ් බස්රථය වර්ෂ දෙකකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේද, පිරිවැය රු.1,100,000 ක් වූ සහ 2017 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 82,593 ක් වූ ලංකා අශෝක් ලේලන්ඩ් බස්රථය වර්ෂයකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අම්පාර නින්දවූර් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) ගාල්ල දිස්ත්‍රික් කොග්ගල වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ බර වාහන පුහුණු පාඨමාලාවට අයදුම්කරුවන් ඉල්ලුම්කර නොමැති වීම නිසා පුහුණු කටයුතු ආරම්භකර නොතිබූ අතර 2016 වර්ෂයේදී පුහුණු කටයුතු සඳහා අනුයුක්ත කර තිබූ බස් රථය වසරකට වැඩි කාලයක සිට නිශ්කාර්යව පුහුණු මධ්‍යස්ථාන භූමියේ ගාල්කර තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර දැරූ නිලධාරියා 2015 මැයි 05 දින සිට අධ්‍යක්ෂ මුදල් තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර එම නිලධාරියා 2018 සැප්තැම්බර් 03 දින සිට එම තනතුරේ ස්ථිරකර තිබූ නමුත් 2015 මැයි මාසයේ සිට අධිකාරියේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා ස්වාධීන සුදුසුකම්ලත් ස්ථිර නිලධාරියෙකු පත්කිරීම සඳහා අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 2,433 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1,876 ක් වූයෙන් පුරප්පාඩු 557 ක් වී තිබුණි. පුරප්පාඩුවලින් 441 ක් උපදේශකවරුන් වීම නිසා ඉලක්ක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව පැවැත්වීමට නොහැකි වී තිබුණි. බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීමේදී නිලධාරීන්ට පෞද්ගලික වන සේ ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල තනතුරු 149 ක් ලබා දී තිබූ අතර දැනට එයින් තථ්‍ය තනතුරු සංඛ්‍යාව 98 ක් විය.

## 5 තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 හි සඳහන් පරිදි, ආයතනවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුකරගැනීම සඳහා උක්ත චක්‍රලේඛයේ 07 ඡේදයේ සඳහන් පරිදි විගණන වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආයතනය සතුව නිලධාරීන් 12 දෙනෙකුගෙන් සැදුම්ලත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද විගණන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කටයුතුවල පැවති අඩුපාඩු සහ පූර්ව විගණන කටයුතුවල යෙදීම වැනි කටයුතු හේතුවෙන් එම ඒකකය පවත්වාගෙන යාමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

## 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 6.3.3 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ වගකීම ප්‍රසම්පාදන කමිටුව වෙත පැවරී තිබුණද අවස්ථා 06 කදී ලංසු විවෘත කිරීමේ කමිටුවේ සාමාජිකයන් පත්කිරීම අධිකාරියේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) විසින් සිදුකර තිබුණු බව විගණන නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) ඡේදය ප්‍රකාරව වැල්ලවායවත්ත පුහුණු මධ්‍යස්ථානය නවීකරණ කිරීමේ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලය 2017 ජුනි 10 දිනෙන් අවසන් වී තිබුණද අදාල වැඩ නිම කර නොතිබුණු අතර කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 ඡේදය අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සඳහා විෂය සම්බන්ධ දැනුම ඇති පුද්ගලයෙකු පත්කළ යුතු වුවද වැල්ලවායවත්ත දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන කමිටුවට විෂයගත ඉදිකිරීම් කටයුතු පිළිබඳ දැනුමැති නිලධාරියෙකු ඇතුළත්ව නොතිබුණි.

(ඈ) නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් තරඟකාරී මිලගණන් කැඳවා ආපනශාලාව බාහිර පාර්ශවයකට බදු පදනමට ලබාදෙන ලෙස 2017 ජනවාරි 23 වන දින අධිකාරියේ අධ්‍යක්ෂ (පාලන) වෙත දන්වා තිබූ නමුත් මේ සඳහා වූ තාක්‍ෂණ ඇගයීම් කමිටුව පත් කිරීම් කටයුතු මාස 07 ක් ප්‍රමාද වී තිබුණි.

(ඉ) ලංසු කැඳවීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ සහිතව සැපයුම්කරුවෙකු නම් කර 2017 නොවැම්බර් 20 දින ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත්කර තිබූ නමුත් 2018 අගෝස්තු 31 දින වන විටත් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දී නොතිබූ අතර තීරණ ලබාදීම ප්‍රමාද කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. මේ නිසා විගණන දිනය වූ 2018 අගෝස්තු 31 දින දක්වාම නව සැපයුම්කරුවෙකු තෝරාගෙන නොතිබූ අතර පෙර සැපයුම්කරු විසින්ම ආපනශාලාව පවත්වාගෙන යමින් පැවතුණි.

(ඊ) 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දක්වාම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක්ද නොමැතිව ආපනශාලාව පවත්වාගෙන යන ආපනශාලා බදුකරු විසින් 2017 දෙසැම්බර් 05 දින අධිකාරියේ උපසභාපති වෙත ඉදිරිපත් කළ ලිපියකට අනුව ඔහු වැඩිම කුලී මුදලක් ඉදිරිපත්කර තිබූ බවත් ආපනශාලාව පවත්වාගෙන යාමේ අවස්ථාව ඔහුට හිමිනොවුන බැවින් සාධාරණයක් ඉටුකරන මෙන් ඉල්ලා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.4.1 ප්‍රසම්පාදන ක්‍රියාවලියේ රහස්‍යභාවය ආරක්‍ෂා කරගත යුතු වුවත් ප්‍රසම්පාදන තීරණ ලබාදීමට ප්‍රථම ලංසු ප්‍රදානය පිළිබඳ බාහිර පාර්ශවයන් වෙත තොරතුරු හෙළිදරව් කර තිබීමෙන් සම්බන්ධිත පාර්ශවයන් විසින් එම ක්‍රියාවලියේ රහස්‍යභාවය ආරක්‍ෂා කර නොතිබුණු බව නිරීක්‍ෂණය විය.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැල්ලවායවත්ත පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා 2016 අගෝස්තු 19 දින ගිවිසුමකට එළඹ තිබූ අතර 2017 ජුනි 10 දිනට ඉදිකිරීම් නිම කල යුතු විය. එසේ වුවද දින 124 ක ප්‍රමාදයකින් පසුව 2017 ඔක්තෝබර් 11 දිනදී ගොඩනැගිල්ලේ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට යටත්ව අධිකාරිය විසින් ගොඩනැගිල්ල භාරගෙන තිබූ අතර ප්‍රමාද දින සඳහා සම්පූර්ණ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(ආ) මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා රු. 42,613,557 ක ගිවිසුම්ගත වටිනාකමක් සහිතව වැඩහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ 2013 ඔක්තෝබර් 07 දින ගිවිසුමකට එළඹ තිබූ අතර එම ගිවිසුම ප්‍රකාරව එහි වැඩ 2014 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වුවද එදිනට කළ වැඩවල වටිනාකම රු. 19,353,158 ක් වූයෙන් වැඩ අවසන් කර භාර නොදීම මත 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් කාර්යය අත්හිටුවා තිබුණි. එම තීරණයට එකඟ නොවූ පෞද්ගලික සමාගම සමථකරණ මණ්ඩලයක් වෙත මෙම සිද්ධිය යොමු කර තිබුණි. අධිකාරිය විසින් උපදේශන ආයතනයක උපදෙස් මත 2015 ඔක්තෝබර් 25 දින සකස් කරන ලද අවසන් බිල්පත අනුව කොන්ත්‍රාත් සමාගමෙන් රු.3,819,000 ක මුදලක් ආපසු අයකර ගත යුතුව තිබුණි. ඉදිකිරීම් කාර්යය වෙනත්

කොන්ත්‍රාත් ආයතනයක් ලවා නිම කිරීම සඳහා 2016 අප්‍රේල් 08 දින නැවත ලංසු කැඳවා තිබුණද ඉදිකිරීම් කළ මුල් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹ නොතිබීම හේතුවෙන් දෙවන වරට කැඳවූ ලංසු ඇගයීම් කටයුතු අත්හිටුවීමට 2016 ඔක්තෝබර් 27 දින පැවැත්වූ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. කෙසේ වුවද 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් වැඩ වසර තුනකට වැඩි කාලයක සිට අත්හිටුවා තිබුණි.

(ඇ) i නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාතලේ කයිකාවල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා දින 180 කින් ඉදිකිරීම් වැඩ නිම කිරීමට 2017 අප්‍රේල් 25 දින රු.17,679,003 කට ගිවිසුමකට එළඹ තිබුණි. නවීකරණ කටයුතු සිදුකිරීමේදී යකඩ කාප්ප සවිකර තිබූ කොන්ක්‍රීට් කොටස අපරීක්ෂාකාරී ලෙස ඉවත්කර ඇති බවත් පළපුරුදු අධීක්ෂණ නිළධාරියෙකුගේ අධීක්ෂණය නොමැති වීම හේතුවෙන් පැරණි ගොඩනැගිල්ලට හානි සිදු වී ඇති බවත් 2017 ජුනි 08 දින අධිකාරියේ ඉදිකිරීම් අංශයේ අධ්‍යක්ෂ සිදුකළ පරීක්ෂාවේදී නිරීක්ෂණය කර තිබුණි. මූලික ඇස්තමේන්තු සැකසීමේදී ගොඩනැගිල්ලේ පැවති ගඩොල් කුළුණු මත කොන්ක්‍රීට් තලාදයක් ඉදිකොට ඒ මත යකඩ කාප්ප සවිකිරීමට සැලසුම් කොට තිබුණද, වහලය ඉවත්කිරීමේදී කුළුණු වලට හානි වීම නිසා නව කොන්ක්‍රීට් කුළුණු ඉදිකිරීමට සිදුව ඇති බව දන්වා තිබුණි. ඒ අනුව රු.1,170,000 ක අළුත් කොන්ක්‍රීට් කණු ඉදිකිරීම වෙනුවෙන් රු.1,707,900 ක සියයට 10 ක් වූ අවිනිශ්චිත මුදල් සීමාව තුල දැරීමට සභාපතිගේ අනුමැතිය ලබාගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. කෙසේ වුවද නොසැලකිලිමත්ව කාර්යය ඉටුකල නිලධාරීන් නිශ්චය කර මෙම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. අයහපත් කාලගුණික තත්ත්වයත්, නාදුනන ගම්වාසීන්ගේ තර්ජන නිසා ශ්‍රමිකයන් සේවයට අකමැතිවීම හා අතිරේක වැඩ සඳහා අමතර මුදලක් නොගෙවීම හා වහලය වෙනස් කිරීම සඳහා තොරතුරු ලැබීම ප්‍රමාද වීම හා ගෙවීම් ප්‍රමාදය යන හේතුන් මත ඉහත කොන්ත්‍රාත්තුවේ කාලය 2018 අප්‍රේල් 10 දක්වා කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා විධිමත් පරිදි උපදේශක සේවා ලබා නොදීම, සැලසුම සැකසීමේදී මායිම් නිසි ලෙස හඳුනා නොගැනීම සැලසුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

iii. 2018 ජනවාරි 31 දිනෙන් ඉදිකිරීම් කාලය අවසන්වීමට නියමිතව තිබුණද ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමබලකායක් නොයෙදීම හා අවශ්‍ය අමුද්‍රව්‍ය නිසි වේලාවට වැඩබිමට නොසැපයීම පිළිබඳ උපදේශක ආයතනය හා අධිකාරිය මඟින් වරින්වර කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබූ නමුත් සිදුකර ඇති ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය සියයට 60 ක් පමණ වූ බව ප්‍රගති වාර්තාවල දක්වා තිබූ අතර 2018 ජූලි 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) i. අහංගම හෝටල් පාසල නවීකරණය සඳහා රු.110,355,000 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමකට 2014 ඔක්තෝබර් 24 දින එළඹ තිබූ අතර දින 240 කින් නවීකරණ කටයුතු අවසන් කළ යුතු විය. එහෙත් 2017 දෙසැම්බර් 31 දින වන විටද අවසන් කර භාරදී නොතිබුණි. එය පිහිණුම් තටාකයක්, සුඛෝපභෝගී කාමර ලෙස නවීකරණය කළ කාමර 13 ක් සහිත අංග සම්පූර්ණ හෝටලයක් ලෙස වරින්වර සැලසුම් වෙනස් කරමින් නවීකරණය කර තිබුණි.

ii. මූලික නවීකරණ සැලැස්මට ඇතුළත් නොවූ මුළුතැන්ගෙය නවීකරණ කටයුතු පසුව සිදුකිරීමට තීරණය කර එම කටයුතු 2017 දෙසැම්බර් 23 දින රු. 4,920,314 ක වටිනාකමකට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණු අතර 2018 ජනවාරි 12 දින අවසන් කිරීමට නියමිත විය. අධිකාරිය මඟින් අවශ්‍ය සැලසුම් හා උපදෙස් ලබානොදීම නිසා ඉදිකිරීම් ප්‍රමාදවීමට හේතුවී තිබුණු අතර 2018 ජුනි 05 දක්වා නැවත කාලය දීර්ඝ කර තිබුණි.

iii. නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති ආධාර මත කොන්ත්‍රාත් වටිනාකම රු.162,707,530 ක් වූ හොටල් පාසලක්, ආසන්න වෙනත් ස්ථානයක ඉදිකිරීම 2017 පෙබරවාරි 02 දින ආරම්භකර තිබූ අතර ගිවිසුම අනුව 2018 අගෝස්තු 01 දිනට එහි ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු වුවත් එහි ඉදිකිරීම් කටයුතුද අවසන්ව නොතිබුණි. තවද ඒ හේතුවෙන් 2014 වර්ෂයේදී නවතා දමන ලද පාඨමාලා හතර 2018 වර්ෂය වන විටත් ආරම්භ කිරීමට නොහැකිවීමෙන් අරමුදල් සපයා දී තිබූ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ හා අධිකාරියේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඉ) හෝටල් පාසලේ පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම්කර නොතිබියදී බේකරි, භෝජනාගාර සේවක, කාමර සේවක හා අරක්කැමි යන පාඨමාලා සඳහා අවශ්‍ය රු.10,931,904 ක් වූ පුහුණු උපකරණ 2015 හා 2016 වර්ෂවලදී අධිකාරිය විසින් මිලදී ගෙන ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබා දී තිබුණි. මෙම භාණ්ඩ ගබඩා කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලයේ ඉඩ පහසුකම් නොමැති නිසා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 3 ක හා නවීකරණ කටයුතු සිදු කරන ආදර්ශ හෝටල් පාසල තුල භාවිතයකින් තොරව අනාරක්ෂිතව, අක්‍රමවත් ලෙස හා නිෂ්කාර්යව තබා තිබූ බව 2018 මැයි 05 දින කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. සමහර භාණ්ඩවල වගකීම් කාලය ඉක්මවා තිබූ අතර ඇඳ ඇතිරිලි, තුවා වැනි භාණ්ඩ ආරක්ෂිතව ගබඩා නොකිරීම නිසා විනාශයට පත් වී තිබුණි. තවද මෙම භාණ්ඩ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි පොත්වල ඇතුළත් කර නොතිබූ අතර 2015,2016 හා 2017 වර්ෂවලදී අදාල භාණ්ඩ පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් සමීක්ෂණයන් සිදුකර වාර්තා කර නොතිබුණි.

(ඊ) 2017 වර්ෂය තුළ මිලදී ගත් රු.6,767,868 ක් වූ හෝටල් උපකරණ තොගයක් හා රු. 6,758,049 ක් වටිනා ගෘහ භාණ්ඩ අහංගම හෝටලය වෙත ලබා දී තිබුණද නවීකරණ කටයුතු අවසන් නොවීම හා හෝටලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම අධිකාරිය සතුව නොමැතිවීම හේතුවෙන් එම භාණ්ඩ හා උපකරණ නිශ්කාර්යව පැවතුණි. හෝටලය ඉදිකරන ලද ඉඩම දකුණු පළාත් සංචාරක කාර්යාංශයට අයත් වූ අතර ගිවිසුම අනුව ඉඩම පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා පමණක් ලබාදී තිබුණු බැවින් හෝටලයක් ලෙස පැවැත්වීමේ හැකියාව පිළිබඳ විගණනයේදී ගැටළුකාරී විය.

## 6.3 අයවැය පාලනය

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය වියදම් දැරීමෙන් පසු 2018 වර්ෂයේදී සංශෝධනය කර තිබූ අතර ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය 2018 පෙබරවාරි 27 දින ලබාගෙන තිබුණි. ඒ අනුව වියදම් දැරීමේදී අයවැය ලේඛනය කාලීනව සමාලෝචනය කර අදාල සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබූ බවත් ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම්වල සියයට 14 සිට සියයට 100 දක්වා විචලතාවන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය කළමනාකරණ මූල්‍ය පාලන උපක්‍රමයක් ලෙස භාවිතා කර නොතිබුණි.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

මාගේ පසුගිය වාර්තාවෙන් පෙන්වා දෙන ලද පහත ඌනතාවයන් සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(අ) අධිකාරියට අයත් කැබ් රථයක් 2003 වර්ෂයේදී අනතුරට ලක්වී තිබූ අතර එම අනතුර සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කමිටුවක් පත්කර තිබුණේ වර්ෂ 06 කට පසුව 2009 පෙබරවාරි මාසයේදීය. එම පරීක්ෂණ කමිටු වාර්තාවට අනුව අනතුරෙන් වූ රු. 421,000 ක අලාභයෙන් රු. 185,333 ක් රියදුරුගෙන් ඉතිරි රු. 235,667 තවත් නිලධාරීන් 04 දෙනෙකුගෙන් හා රු. 135,000 ක් වටිනා අමතර කොටස් නැතිවීම සම්බන්ධයෙන් වාහන භාරව සිටි නිලධාරීන්ගෙන්ද අයකර ගන්නා ලෙසට නිර්දේශ කර තිබුණද එම නිර්දේශ 2017 ඔක්තෝබර් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. 2015 වර්ෂය දක්වාම වාහනයේ අනතුර පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර දැනට එම වාහනය අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ලෝක සංචාරක දිනය සැමරීම වෙනුවෙන් සැලසිනේ ආයතනයට ගෙවීම සඳහා 2012 පෙබරවාරි මාසයේ දී රු.7,500,000 ක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ආයතනයෙන් ලැබී තිබුණි. අදාළ ගෙවීම් කිරීමෙන් අනතුරුව ඉන් ඉතිරි වූ රු.1,000,000 ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව 2015 වර්ෂයේ දී අධිකාරියේ ආදායමට ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් 2015 සහ 2016 වර්ෂය තුලදී අවස්ථා 2 කදී ටෝනර් 09 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.101,650 ක ව්‍යාජ ඉන්වොයිසි පදනම් කරගෙන ගෙවා තිබූ අතර අදාල භාණ්ඩ ගබඩාව වෙත ලැබී නොතිබියදී කළමනාකරණය විසින් ලබා දෙන ලද උපදෙස් අනුව තොග පොත්වල භාණ්ඩ ලැබීම් ලෙස ඇතුළත් කර තිබුණි. අදාල ගෙවීම් වවුචර වල සඳහන් නොවන වෙනත් පුද්ගලයෙකුගේ නමකට ගෙවීම් සඳහා වූ චෙක්පත් නිකුත්කර තිබුණි. තවද මිලදී ගැනීම් හා චෙක්පත් සම්බන්ධ කටයුතු කරන නිලධාරිනියට හා චෙක්පත් නිකුත් කරන ලද පුද්ගලයාගේ බද්ධ ගිණුමකට එම මුදල් සාවද්‍ය ලෙස බැර කරගෙන තිබූ බව නිරීක්ෂණය විය. අධිකාරිය විසින් අදාල නිලධාරීන් සම්බන්ධ මූලික පරීක්ෂණයක් පවත්වා අවසන්කර තිබුණත් 2018 ජූලි 31 දින වන විටත් අවසාන පරීක්ෂණයේ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

(ඈ) මූල්‍ය අක්‍රමිකතා මත 2011 වර්ෂයේ වැඩ තහනම් කර නඩු පවරා තිබූ නිලධාරියෙකුට අනුමැතියකින් තොරව 2011 සිට 2013 කාලය දක්වා වැටුප් වශයෙන් රු. 1,711,961 ක් ගෙවා තිබූ අතර මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය වන තෙක්ම කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | - | බඳවා ගැනීමේ අවම සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බඳවා ගෙන තිබීම. |

| | | | |
|---|---|---|---|
| | | - | පුරප්පාඩු තනතුර සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම හා වැඩ බැලීමේ පදනම මත දීර්ඝ කාලීනව නිලධාරීන් යෙදවීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | - | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් නොපැවැත්වීම. |
| | | - | වත්කම් හඳුනා ගැනීමේ කේත භාවිතා නොකිරීම |
| | | - | නිෂ්කාර්ය වත්කම් පැවතීම |
| | | - | සියළු වත්කම් ඉන්වෙන්ට්‍රිගතව පැවතීම තහවුරු නොවීම හා වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | - | කාර්යභාරයන් බෙදීම හා ඒවා අභ්‍යන්තර පරීක්ෂා වන පරිදි ක්‍රියාත්මක නොවීම. |
| | | - | අධීක්ෂණ කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම |
| (ඈ) | ගිණුම්කරණය | - | විධිමත් අනුමැතියකින් තොරව ජ'නල් සටහන් වෙනස් කිරීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | - | කාර්යසාධන සුරක්ෂණ කල් ඉකුත්වීමට පෙර දින දීර්ඝ නොකිරීම. |
| | | - | ගොඩනැගිලි ඉදිකරන ඉඩම්වල නිශ්චිත මායිම් දැක්වීම ඇතුලු පහසුකම් හා උපදෙස් කොන්ත්‍රාත්කරු වෙත ලබා නොදීම. |
| | | - | කොන්ත්‍රාත් කටයුතු අධීක්ෂණය නොකිරීම. |
| (ඊ) | කාර්ය සාධනය | - | කාර්ය සාධනය ඉලක්ක, සැසදීම හා වෙනස්කම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. |